රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 01/2004

මගේ අංකය : ආ/9/2/2/1(3)
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2004.02.23

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**බඳවා ගැනීමේ පරිපාටිවලින් බැහැරව රජයේ සේවයට බඳවාගත්**
**<u>නිලධාරීන්ට වයස අවුරුදු 55 න් ඔබ්බට සේවා දිගු ලබා දීම</u>**

උක්ත මැයෙන් වූ 2003.12.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/96(1) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ විධිවිධාන වැරදි ලෙස අර්ථ නිරූපණය කරමින් සහන ලැබිය යුතු සමහර නිලධාරීන්ටද හිමි සහන ලබා දී නැති බව වාර්තා වී ඇත.

03. 2003.09.17 දිනට ප්‍රථම විශ්‍රාම ගිය නිලධාරියෙකු නිලධාරියකු සම්බන්ධව එම චක්‍රලේඛයේ 1 (අ) උපපේදයේ විධිවිධාන අදාළ වන අතර, 2003.09.17 දිනට හෝ ඊට පසුව (වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස වන) අවුරුදු 55 එළඹෙන නිලධාරියකු සම්බන්ධව චක්‍රලේඛයේ 1 (ආ) උපපේදයේ විධිවිධාන යටතේ කටයුතු කළ යුතු බව මින් අවධාරණය කරනු ලැබේ.



එස්.සී. මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ
සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය